**ගිරිබාව ප්‍රාදේශීය සභාව.**
**කුරුණෑගල දිස්ත්‍රික්කය.**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 25 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 26 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ගිරිබාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිකර තිබූ දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 07 කින් අයවිය යුතු අනුකූලතා සහතික ගාස්තු හා ප්‍රමාද ගාස්තු රු.438,150 ක් ගිණුම් ගත කර නොතිබුණි. | ලැබිය යුතු ආදායම් හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම සකස් කරන අවස්ථාවේදී අදාළ ගැලපීම් නිසි පරිදි සිදුකරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට පොදු ගබඩා තොග ශේෂය තොග ලේඛනයට අනුව රු.1,056,621 ක් වුව ද මූල්‍ය ප්‍රකාශන අනුව රු. 719,310 ක් වූ බැවින් රු. 337,311 ක වෙනසක් පැවතුණි. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම සකස් කරන අවස්ථාවේදී අදාළ ගැලපීම් නිසි පරිදි සිදුකරමි. |
| (ඇ) | සභාව සතු සුසාන භූමි 37 ක හා පොදු ඉඩම් කොටස් 11 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | සභාව භුක්ති විඳින ඉඩම්වල අයිතිය පවරාගෙන වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී ගිණුම් සකස් කිරීමේදී එම වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

**1.4** **අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/ 8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය | සභා බල ප්‍රදේශයේ පිහිටි සම්ප්‍රේෂණ කුළුණු වලින් ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | ගැසට් පත්‍රය අනුව ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභා බල ප්‍රදේශයේ පිහිටි සම්ප්‍රේෂණ කුළුණු වලින් සභාවට ලැබිය යුතු ආදායම් ලබාගැනීම සඳහා අදාළ ආයතන වෙත ලිපි යොමුකර ඇත. |

**02.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 326,804 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන අදායම ඉක්ම වූ වියදම රු. 259,139 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018වර්ෂය | | | | 2017 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | | රු. | රු. | රු. | රු. |
| I. | වරිපනම් හා බදු | 415,000 | 457,260 | 457,260 | - | 385,000 | 390,845 | 390,845 | - |
| II. | කුලී | 2,710,400 | 3,049,865 | 3,049,865 | 220,603 | 2,938,600 | 3,520,480 | 3,520,480 | - |
| III. | බලපත්‍ර ගාස්තු | 415,000 | 397,150 | 397,150 | - | 410,000 | 410,000 | 373,825 | 36,175 |
| IV. | වෙනත් ආදායම් | 37,390,004 | 33,306,111 | 7,244,780 | 4,358,586 | 8,990,000 | 8,990,000 | 4,139,557 | 4,850,443 |
| එකතුව | | 40,930,404 | 37,210,386 | 11,149,055 | 4,579,189 | 12,723,600 | 13,311,325 | 8,424,707 | 4,886,618 |

## 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ පවතින දියුණු නාගරික ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් කලාපයක් ලෙස නම් කිරීමට කටයුතු කර නොතිබුණි. | දියුණු නාගරික ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් කලාපයක් ලෙස නම් කිරීමට කටයුතු කළ යුතු වේ. | ගිරිබාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු නාගරික ප්‍රදේශයක් මේ වන විට හඳුනාගෙන ඇති අතර මහ සභාවේ තීරණය ලබා ගැනීමෙන් අනතුරුව කඩිනමින් එම ප්‍රදේශය කේන්ද්‍ර කොටගෙන වරිපනම් කලාපයක් ඇති කිරීමට කටයුතු කරමි. |

## 2.2.3 කුලී

### (අ) කඩ කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|

| | | | |
|---|---|---|---|
| (i) | ගිවිසුම් ගත කොන්දේසි වලට පටහැනිව ගිරිබාව බස් නැවතුම්පල කඩ කාමර 02ක් , පැරකුම්පුර කඩ කාමර 01ක්, හත්පීකුච්චි කඩකාමර 04 ක් වශයෙන් කඩකාමර 07ක් උප බදු දී තිබුණි. | ගිවිසුම් ගත කොන්දේසි කඩකිරීමට එරෙහිව ගිවිසුම ප්‍රකාරව ක්‍රියා කළ යුතු වේ. | ගිරිබාව ප්‍රාදේශිය සභාවට අයත් දේපල උප බදු දීම නීති විරෝධී ක්‍රියාවක් වන බව විගණනයේ දී අනාවරණය කර දී තිබුණි.ඒ පිළිබඳව ගිවිසුම්ගත බදුකරුවන් දැනුවත් කිරීමෙන් අනතුරුව ගිරිබාව බස් නැවතුම්පල කඩ කාමර 02 හා යාය 03 පැරකුම්පුර කඩ කාමරය බදුකරු විසින්ම පවත්වාගෙන යාමට එකඟත්වය පල කරන ලදි.උප බදු ලබා දී තිබූ හත්පීකුච්ඡි කඩ කාමර 04 ක් සඳහා 2019/02 චක්‍රලේඛයට අනුගත වෙමින් එම උප බදුකරුවන් සඳහා නව ගිවිසුම් අත්සන් කිරීමට තීරණය කර ඇත.ඒ පිළිබඳව 2019.05.08 දින පැවති මහ සභාවේ තීරණ අංක 6/2019/14/03 යටතේ එම යෝජනාව සභා සම්මත වී ඇත. |
| (ii) | ගිවිසුම් අත්සන් කළ බදුකරුවන් 07 දෙනෙකු විසින් 2006 සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ කඩකාමර 07 ක් සභාව දැනුවත් කිරීමෙන් තොරව බාහිර පාර්ශවයන්ට රු. 2,030,000 කට විකුණා තිබුණි. | ගිවිසුම් ගත කොන්දේසි අනුව කටයුතු කළ යුතු වේ. | ගිරිබාව ප්‍රාදේශීය සභාව සමඟ ගිවිසුම්ගත වූ බදුකරුවන් 07 දෙනෙකු වෙනත් පාර්ශවයක් වෙත කඩ කාමර පවරා දී තිබූ අතර 2019/02 නව චක්‍රලේඛයට අනුව නව කඩ කාමර හිමියා වෙත ගිවිසුම්ගත වීමක් සහිතව කඩ කාමරය පවරා දීමට කටයුතු කරමි. |

### 2.2.4 වෙළඳ බලපත්‍ර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පරිසර බලපත්‍ර ලබාගෙන තිබුණු ආයතන 13ක් වෙළඳ බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | නියමිත දිනට පෙර බලපත්‍ර ගාස්තු ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම ව්‍යාපාරිකයන් වෙත වෙළඳ බලපත්‍රය රැගෙන යන ලෙස දන්වා ලිපි මඟින් දැනුවත් කර ඇති නමුත් වෙළඳ බලපත්‍රය රැගෙන යාමට පැමිණ නැත.එසේ වුව ද ක්ෂේත්‍රයේ ආදායම් රැස් කිරීම මඟින් අදාල වෙළඳ බලපත්‍ර ගාස්තුව ලබා ඇත.මේ වන තෙක් තැපැල් මඟින් වෙළඳ බලපත්‍රය නිකුත් කිරීම සිදු නොකළ අතර 2019 වර්ෂයේ සිට ඉදිරියට තැපැල් මාර්ගයෙන් හෝ වෙළඳ බලපත්‍රය නිකුත් කිරීමට පියවර ගනිමි. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය , පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුවවිහරණය හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් සභාවේ අවශ්‍යතාවය අනුව කිසිඳු අතුරු ව්‍යවස්ථාවක් පනවා නොතිබූ නමුත් සම්මත අතුරු ව්‍යවස්ථාව වැළඳගෙන තිබුණි. | සභාවේ අවශ්‍යතාවය පරිදි අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතු වේ. | සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳගෙන ඇත. සභාවට අනන්‍ය වන පරිදි අතුරු ව්‍යවස්ථා කඩිනමින් පනවා ගැනීමට කටයුතු කරමි. |

#### (ආ) අත්හැර දැමූ කර්තව්‍යන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 වර්ෂයේ එක්ගමකට එක් වැඩසටහනක් යටතේ ඉදිකිරීම ආරම්භ කර රු.352,432 ක ගෙවීම් කර තිබුණු පතනේවැව පෙර පාසල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම අත්තිවාරමට පමණක් සීමා වී තිබුණි. | අදාළ ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කළ යුතු වේ. | ගිරිබාව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද එක් ගමකට එක් වැඩක් වැඩසටහන 2014 යටතේ ලක්ෂ හයක ප්‍රතිපාදන යටතේ පතනේවැව පෙර පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු සිදුකරන ලදී. වෙන් කරන ලද මුදලට අනුව සිදුකිරීමට හැකියාව ලැබී ඇත්තේ ගොඩනැගිල්ලේ කොටසක වැඩ පමණි. |

**3.2 වත්කම් කළමනාකරණය**

**3.2.1 නිශ්ක්‍රීය /ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතුව පවතින රු.1,536,300 ක් වටිනා වත්කම් 02ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිශ්ක්‍රීය තත්ත්වයේ පැවතුණි. | නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම් අලුත් වැඩියා කිරිමට හෝ ඉවත් කිරීමට කටයුතු කළ යුතු වේ. | කැබ්රථය සහ ජල බවුසරය අලුත්වැඩියා කිරිම සඳහා පළාත් පාලන යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ පිරිවිතර වලට යටත්ව මිල ගණන් කැදවා ඇත. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවයෙන් පහකළ හා ස්ථාන මාරුවී ගියනිලධාරීන් තිදෙනෙකුගෙන් වසර 06 සිට වසර 29 ක කාලයක් තුළ නිරවුල් නොවී පවතින ණය ශේෂය රු. 33,888 ක් විය. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිග මුදල් අයකරගැනීම සඳහා අදාළ ආයතන හා ඇපකරුවන් දැනුවත් කිරීමට ලිපි යොමු කොට ඇත. |

**3.4 ප්‍රසම්පාදන**

**3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිලියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයට ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කොට ඇති බව දන්වමි. |

**3.4.2 සැපයීම් හා සේවා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ මිල ගණන් කැඳවීමකින් තොරව අවස්ථා 04 කදී රු. 423,790 ක් වටිනා උපකරණ මිලට ගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුයි. | මෙවැනි අඩුපාඩු නැවත සිදු නොකිරීමට වග බලා ගනිමි. |

**3.4.3 කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ සැරසුම්ගල ග්‍රාම නිලධාරි වසමේ මාර්ග දෙකක කුට්ටි ගල් අතුරා ප්‍රතිසංස්කරණයට රු. 3,735,732 ක් ගෙවා තිබුණු අතර භෞතික පරීක්ෂණ අවස්ථාව වන විට මාර්ග දෙපස කොන්ක්‍රීට් වැටි නියමිත පරිදි 1:2:4 (3/4) මිශ්‍රණයෙන් ඉදිකර නොතිබුණු බැවින් පහසුවෙන් කඩා වෙන් කළ හැකිව තිබුණි. | නියමිත මිශ්‍රණයෙන් ඉදිකිරීම් කළ යුතු වේ. | දුර්වල තත්වයේ ඇති කර්බ් කොටස් කපා ඉවත් කර නැවත 1:2:4(3/4)" කොන්ක්‍රීට් මිශ්‍රණයෙන් කොන්ත්‍රාත් සමිතිය ලවා සකස් කරවාගෙන රැඳවුම් මුදල් නිදහස් කිරිමට කටයුතු කරමි. |
| (ආ) | 2018 වර්ෂයේ පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ ගිරිබාව පොළ පාර සංවර්ධනය කිරීම සඳහා රු. 498,912 ක් ගෙවා තිබුණු නමුත් භෞතික පරීක්ෂණ අවස්ථාව වන විට මාර්ගයේ ස්ථාන කිහිපයක් ගිලා බැස මාර්ගයට හානි වී තිබුණි. | ගිලා බැස ඇති ස්ථාන නැවත සකස් කළ යුතු වේ. | මෙම මාර්ගය ගිරිබාව සතිපොළ සඳහා ප්‍රවේශ වීමට පවතින ප්‍රධාන පිවිසුම් මාර්ගය බැවින් සතිපොල සඳහා පැමිණෙන සියළුම වාහන මෙම මාර්ගය ඔස්සේ ගමන් කරයි. ඒ අනුව මාර්ගයේ ගස් ඉවත් කරන ලද කොටස අනෙක් ස්ථානවලට සාපේක්ෂව ඉතා සුළු ප්‍රමාණයක් ගිලා බැසිමට ලක්ව ඇත. රැඳවුම් මුදල් නිදහස් කිරිමට ප්‍රථම එම ස්ථානය කොන්ත්‍රාත් සමිතිය හරහා නිසි පරිදි සකස් කරවා ගැනිමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 වර්ෂයේ ප්‍රජා ජල ව්‍යාපෘති ප්‍රතිපාදන යටතේ තඹුත්ත ජල ව්‍යාපෘතිය සඳහා රු.730,573 ක් ගෙවා තිබුණද ඩී 1 සිට ඩී 11 දක්වා වැඩ විෂයන් ද , සී1 සිට සී12 දක්වා වැඩ විෂයන් ද තීන්ත ආලේපය ද නිසි අයුරින් කර නොතිබුණි. | අදාළ ඉදිකිරීම්වල අඩු පාඩු නිවැරදි කළ යුතු වේ. | ඉංජිනේරු උපදෙස් මත වැඩ අංක D-1 සිට D-11 දක්වා වූ වැඩ විෂයන් හි පවතින අඩුපාඩු කොන්ත්‍රාත් සමිතිය විසින් සකස් කරවිමට හෝ එසේ සිදුකළ නොහැකි ස්ථාන සඳහා ගෙවිම් කටයුතු සිදු නොකිරිමටත් කටයුතු කරමි. සියළු අඩුපාඩු සකස් කරවීමෙන් අනතුරුව ගෙවිම් කටයුතු සිදු කිරිමටත් කටයුතු කරමි. |